**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# පරීක්ෂක වාර්තාව

අදියර II විභාගය - 2023 ජූලි

## (202) අංකිත (ඩිජිටල්) පරිසරයේ තොරතුරු පද්ධති

**(Information Systems in Digital Environment)**

---

මෙම ප්‍රශ්න පත්‍රය තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණයේ නව වර්ධනයන් සහ ප්‍රවණතා පිළිබඳව වැඩි සැලකිල්ලක් දක්වන අතරම තොරතුරු තාක්‍ෂණයේ සමස්ත අංගයන් පරීක්‍ෂා කරන ලදී. මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමේදී තොරතුරු පද්ධති කෙරෙහි බලපෑමක් ඇති කරන සදාචාරාත්මක, සමාජීය සහ නීතිමය පරිසරය පිළිබඳ මනා දැනුමක් ද තිබීම වැදගත් වන බව සඳහන් කළ යුතුය.

මෙම ප්‍රශ්න පත්‍රය **A, B** සහ **C** ලෙස කොටස් තුනකින් සමන්විත විය. මෙම ප්‍රශ්න පත්‍රයේ සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම අවශ්‍ය විය.

### <u>A කොටස</u>

**ප්‍රශ්න අංක. 01**

මෙම කොටස මගින් සම්පූර්ණ විෂය නිර්දේශයම සූක්ෂ්ම ලෙස පරීක්ෂා කර ඇත. අයදුම්කරුවන් කිහිපදෙනෙකු හැර සියල්ලන්ම පාහේ මෙම කොටසට පිළිතුරු සැපයීමට උත්සාහ දරා තිබූ අතර ඒ අතරින් බහුතරයක් සාමාන්‍යයට වඩා ලකුණු ලබගෙන තිබුණි. අයදුම්කරුවන්ගේ පිළිතුරු ලබාදීම සාධනීය මට්ටමක පැවති බව සටහන් කල යුතු වේ.

මෙහි පළමු ප්‍රශ්න 10 ට සාපේක්ෂව දෙවන ප්‍රශ්න 05 සඳහා සාර්ථක පිළිතුරු ලබාදීමේ දුර්වලතාවයක් නිරීක්ෂණය විය.

මෙම කොටසෙහි යම් නිශ්චිත විෂය කොටසක දුර්වල පිළිතුරු දීමේ රටාවක් නිරීක්ෂණය නොවීය.

සමස්ත ප්‍රශ්න පත්‍රයෙන් 25% ක ලකුණු ප්‍රමානයක් ආවරණය වන මෙම කොටසට සාර්ථකව පිළිතුරු ලබානොදීම හේතුවෙන් වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගැනීම දුෂ්කර බැවින් මෙම කොටසට පිළිතුරු ලබා දීම සඳහා පූර්ණ විෂය පථයම අධ්‍යනය කිරීම ඉතා වැදගත් වේ.

### <u>B කොටස</u>

**ප්‍රශ්න අංක. 02**

මෙම ප්‍රශ්නයෙහි **(a) කොටස** මගින් තරඟකාරී ව්‍යාපාරික ලෝකයේ සංවිධානමය සාර්ථකත්වය සඳහා යොදාගන්නා තොරතුරු පද්ධතිවල ගුණාත්මක තොරතුරු වල ලක්ෂණ දෙකක් ද **(b) කොටස** මගින් වෙළඳපොලේ නව සංවර්ධනයන් සඳහා සංවිධානමය ප්‍රතිචාර දක්වීම වැඩිදියුණු කිරීමට තොරතුරු පද්ධති සහ තොරතුරු තාක්ෂණය උපකාර වන ආකාර පිළිබඳව ද, **(c) කොටස** මගින් දී ඇති අවස්ථාවේදී පුද්ගලික තොරතුරු කළමනාකරණය සඳහා භාවිත කිරීමට සුදුසු මෘදුකාංග යෙදුමක් බැගින් හඳුනාගැනීම අපේක්ෂා කරන ලදී.

බහුතරයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු ලබාදීමට උත්සාහ දරා තිබූ අතර ප්‍රශ්නයේ **(a)** සහ **(b) කොටස්** සඳහා පිළිතුරු ලබාදීම සාර්ථක මට්ටමක පැවතියද **(c) කොටසට** පිළිතුරු ලබාදීම යම් දුර්වල මට්ටමක පැවතුණි.

පෞද්ගලික කළමණාකරණයේදී භාවිතාවන තොරතුරු තාක්ෂණික යෙදවුම් පිළිබඳ දැනුමේ දුර්වලතාවයක් දක්නට ඇත.

එදිනෙදා ජීවිතයේ දී භාවිතා වන තොරතුරු තාක්ෂණික යෙදවුම් පිළිබඳ සාමාන්‍ය දැනීමක් සහිතවීම සාර්ථක ලකුණු ප්‍රමාණයක් ලබාගැනීමට ඉවහල් වනු ඇත.

## ප්‍රශ්න අංක. 03

ඵලදායීතාව වැඩිදියුණු කිරීම සඳහා භාවිතා කළ හැකි යෙදුම සහ ඊට උදාහරණ ද දත්ත කළමනාකරණ ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා සුදුසු දත්ත සමුදායක් තෝරාගැනීමට පෙර සලකා බැලිය යුතු සාධක හා දත්ත සමුදාය කළමනාකරණ පද්ධතියක අවාසි පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම මෙම ප්‍රශ්නය මගින් පරීක්ෂාකර ඇත.

බහුතරයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇති අතර ලකුණු ලබාගැනීමද ඉතා හොඳ මට්ටමක තිබුණි.

මෙම ප්‍රශ්නයේ **(b) (i) කොටසට** අවබෝධයකින් තොරව පිළිතුරු සපයා තිබුණි. එමෙන්ම **(b) (ii) කොටසේද** පොදු පිළිතුරු දක්නට ලැබීම බහුල විය. එයින් පෙන්නුම් කරණුයේ දත්ත කළමණාකරණ පද්ධති පිළිබඳ අවබෝධයේ යම් අඩුපාඩු සහිත බවයි.

## ප්‍රශ්න අංක 04

මෙම ප්‍රශ්නය මගින් උපායශීලී සැලසුම්කරණය, උපායමාර්ගික සැලසුම්කරණය, කළමණාකරණ මට්ටම සහ ව්‍යාපාර සම්පත් සැලසුම්කරණ පද්ධති සම්බන්ධ දැනුම පරීක්ෂා කර ඇත.

බහුතරයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා තිබුණි. එමෙන්ම ලකුණු ලබාගැනීමද ඉහල මට්ටමක තිබුණි.

මෙම ප්‍රශ්නයේ **(c) කොටසේදී** පොදු පිළිතුරු දක්නට ලැබුණි. එමගින් විෂය පිළිබඳ පුළුල් දැනුමක් නොමැති බව පෙන්නුම් විය.

## ප්‍රශ්න අංක. 05

මෙම ප්‍රශ්නයෙන් සමාජ මාධ්‍ය, පරිගණක අපරාධවලින් ආරක්ෂා වීමට අදාලව යොදාගත හැකි නීතිමය ප්‍රතිපාදනයන් සහ සහ වළාකුළු පරිගණකගතකරණය පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කර ඇත.

සියළුදෙනාම පාහේ මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට උත්සාහ දරා ඇති අතරම ලකුණු ලබාගැනීමද ඉහල මට්ටමක ඇත.

සමාජ මාධ්‍යය පිළිබඳව අවබෝධයක් රහිත අයදුම්කරුවන් ඉතා ස්වල්පයක් පමණක් සිටිනු දක්නට ලැබුණි.

මෙහි (b) **කොටසට** පිළිතුරු සැපයීමේදී නීතිමය ප්‍රතිපාදන පැහැදිලි කර ඇත්තේ ඉතාමත් සුළු පිරිසක් බව නිරීක්ෂණය විය. එමගින් පෙන්නුම් කරනුයේ පරිගණක අපරාධවලට එරෙහි නීති සම්බන්ධව අයදුම්කරුවන්ගේ දැනුම ඉතා දුර්වල බවයි.

(c) **කොටසේදී** පොදු පිළිතුරු සපයා ඇති බව දක්නට ලැබුණි. එමගින්, පෙන්නුම් කරනුයේ වළාකුළු පරිගණකකරණය සම්බන්ධ දැනුම දුර්වල බවයි.

### ප්‍රශ්න අංක 06

මෙම ප්‍රශ්නය මගින් සමූහ අරමුදල් සහ රොබෝ තාක්ෂණය පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කර ඇත.

අයදුම්කරුවන්ගෙන් බහුතරයක් මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා තිබූ අතර, ඒ අතරින් වැඩිපිරිසක් ඉතා හොඳ ලකුණු ප්‍රමාණයක් ලබා ගෙන තිබුණි.

(a) **කොටසට** සාර්ථක ලෙස පිළිතුරු සපයා නොතිබුණි. එමගින්, පෙන්නුම් කරනුයේ සමූහ අරමුදල් සම්බන්ධව අයදුම්කරුවන්ගේ දැනුම දුර්වල බවයි.

මෙහි (b) **කොටසට** ඉතා සාර්ථකව පිළිතුරු සපයා තිබුණි.

### ප්‍රශ්න අංක 07

මෙම ප්‍රශ්නය සිද්ධි අධ්‍යනය හා සම්බන්ධ ප්‍රශ්නයකි. එනම්, තමා ඉගෙනගත් න්‍යායන්, සත්‍ය ලෝකයේ සිද්ධියක් සමග සම්බන්ධ කරමින් එම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම අපේක්ෂා කරන ලදී. මෙහිදී දේශීයව අවන්හල් ජාලයක් සම්බන්ධව විවිධ කළමනාකරණ මට්ටම් සඳහා භාවිත කළ හැකි තොරතුරු පද්ධති, ජංගම ගෙවීම්, විකල්පයන් භාවිත කිරීමේ ප්‍රතිඵල, තොරතුරු පද්ධති, දත්ත දෘශ්‍යකරණය හා විද්‍යුත් වාණිජ්‍ය පිළිබඳව පරීක්ෂා කරන ලදී.

අයදුම්කරුවන්ගෙන් බහුතරයක් මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට උත්සාහ දරා තිබූ අතර ඔවුන් ඉතා හොඳ ලකුණු ප්‍රමාණයක් ලබාගැනීමට සමත්ව තිබුණි.

මෙම ප්‍රශ්නයේ (a), (b) හා (c) කොටස් සඳහා මධ්‍යස්ථ ලෙස අයදුම්කරුවන් පිළිතුරු සපයා තිබුණි.

නමුත් (d) **කොටසට** පිළිතුරු සැපයීම ඉතාමත් දුර්වල මට්ටමක පැවති බොහොමයක් අයදුම්කරුවන් දත්ත දෘශ්‍යකරණය යන්න අවබෝධ කරගෙන නොමැති බව පෙනී යයි.

(e) **කොටසේ** පිළිතුරු සැලකීමේදී බොහොමයක් අයදුම්කරුවන් පිළිතුරු ලබාදී තිබුණද, ඉන් බොහොමයක් පොදු පිළිතුරු විය.

\- - - -

**<u>කාර්යසාධනය වැඩි දියුණු කිරීම සඳහා ඉඟි:</u>**

**(1)** සම්පූර්ණ විෂය නිර්දේශය හොඳින් අධ්‍යයනය කළ යුතුය.

**(2)** අපේක්ෂකයින් ප්‍රශ්නය හොඳින් කියවිය යුතු අතර ප්‍රශ්නයෙන් ඍජු පිළිතුරක් අපේක්ෂා කරන විට අනවශ්‍ය/අදාළ නොවන පැහැදිලි කිරීම් සහ විස්තර ලිවීම නොකළ යුතුය.

**(3)** තොරතුරු තාක්ෂණයට අදාළව අධ්‍යයන පෙළ, පොත්පත්, ලිපි, සඟරා සහ අනෙකුත් කියවීම් ද්‍රව්‍ය වෙත යොමු වන්න.

**(4)** පිළිතුරු ලිවීමේදී තොරතුරු තාක්ෂණයට අදාළ න්‍යායාත්මක සංකල්ප සහ ප්‍රායෝගික දැනුම සංවිධානාත්මකව ඉදිරිපත් කිරීම සහ අවශ්‍ය තැන්වල උදාහරණ උපුටා දැක්වීම වැදගත් වේ.

**(5)** අත් අකුරු කියවිය හැකි බවත් පිළිතුරු නිසි ලෙස **අංකනය** කර ඇති බවත් සහතික කර ගන්න.

**(6)** විභාග ප්‍රශ්න පත්‍රයේ දක්වා ඇති උපදෙස් පිළිපදින්න.

**(7)** ඔබේ දැනුම වැඩි දියුණු කිරීම සඳහා පෙර ප්‍රශ්න පත්‍ර / නියමු ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු අධ්‍යයනය කරන්න.

**(8)** ඵලදායී කාල කළමනාකරණයක් පුහුණු කරන්න.

**(9)** පිළිතුරු පත්‍ර ඉදිරිපත් කිරීමට පෙර පිළිතුරු නිසි ලෙස අංක කර ඇත්දැයි දෙවරක් පරීක්ෂා කරන්න.

**(10)** හොඳ සූදානමකින් සහ විභාගය සමත් වීමේ උපරිම බලාපොරොත්තුවෙන් විභාගයට මුහුණ දෙන්න.

- * * * -